දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම්
තානාපති ඇලිස් ජී වෙල්ස්
දැක්වූ අදහස්

ඔක්තෝබර් 11, 2018

තානාපතිනී වෙල්ස්: මෙම ඉතා වැදගත් (Track 1.5) සංවාදයේ සංවිධායකයන්ට ස්තුති කිරීමට මට අවශ්‍යයි. මෙහි පැමිණීමට ලැබීම සතුටට කරුණකි.

ඉන්දියානු සාගර කලාපය සඳහා වූ අපේ කැපවීම තියුණු කිරීමත්, සුරක්ෂිත හා සමෘද්ධිමත් අනාගතයක් සඳහා වූ අපේ එකමුතු දැක්ම ඉදිරියට ගෙන යෑමත් සඳහා එක්සත් ජනපදය නිශ්චිත පියවර ගන්නා ආකාර දෙකක් පිළිබඳ ව මගේ අදහස් දැක්වීමේ දී අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

මෙයින් පළමුවැන්න වන්නේ සමුද්‍රීය ආරක්ෂාව සඳහා නව ආයෝජන කිරීමයි. ඒ සඳහා සමුද්‍රීය හැකියාවන් පුළුල් කිරීමට, තොරතුරු බෙදා හදා ගැනීම ප්‍රවර්ධනය කිරීමට හා කලාපයේ ආරක්ෂාව, ස්ථාවර බව හා සෞභාග්‍යයේ ජීවනාලිය වන නිදහස් හා විවෘත නාවික බල ප්‍රදේශයක් සහතික කිරීමට අපේ ඉන්දියානු සාගර හවුල්කරුවන් සමග වැඩ කිරීමයි.

දෙවැන්න වන්නේ දීර්ඝ කාලීන, තිරසාර හා සියල්ලන් ඇතුළත් වර්ධනයක් ඇති කිරීමේ හොඳ ම හා එක ම ක්‍රමය වන, කලාපයේ පුද්ගලික අංශය වැඩි වැඩියෙන් සම්බන්ධ කර ගැනීමට ආධාර කිරීමයි.

කෙසේ වෙතත් මේ කරුණු ගැන සාකච්ඡා කිරීමට පෙර ඉන්දියානු සාගරයේ රටක් වන මාල දිවයිනේ මෑත දී පැවැත්වූ සාර්ථක ජාතික මැතිවරණය ගැන සඳහන් කිරීමට කැමැත්තෙමි. සැලකිය යුතු බාධක මධ්‍යයේ ඔවුන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිය උද්යෝගිමත් ලෙස ප්‍රකාශ කිරීම ගැන මාල දිවයිනේ ජනතාවට එක්සත් ජනපදය ප්‍රසාදය පළ කරයි. ජනාධිපති පදවියට තේරී පත් වූ සෝලි මහතාට ඔහුගේ ජයග්‍රහණය ගැන සුබ පතන අතර මෙම කලාපයේ අපේ හවුල් අරමුණු ඉදිරියට ගෙන යෑම සඳහා ජනාධිපති සෝලි හා ඔහුගේ රජය සමග වැඩ කිරීමට මගේ රජය ඉතා කැමැත්තෙන් සිටින බව ප්‍රකාශ කරමි.

සමුද්‍රීය ආරක්ෂාව සඳහා සහාය වීමට එක්සත් ජනපදය ගන්නා පියවර කීපයක් ගැන කෙටියෙන් සඳහන් කිරීමට මට ඉඩ දෙන්න. ආරක්ෂාව පිළිබඳ අභියෝගවලට හා ස්වාභාවික ව්‍යසනවලට සාර්ථක ලෙස මුහුණ දීමට අවශ්‍ය හැකියාවන් හා තොරතුරු බෙදා හදා ගැනීමේ ජාල ගොඩ නැගීමට කලාපයේ රටවලට ආධාර කරන අපේ බෙංගාල බොක්ක ව්‍යාපෘතිය (Bay of Bengal Initiative) අපි මෑත දී දියත් කළෙමු. මෙම වැඩ සටහනේ ආරම්භක අංගයක් ලෙස ශ්‍රී ලංකාවේ වෙරළබඩ සමුද්‍රීය රේඩාර් පද්ධතිය දියුණු කිරීමට හා සෝදිසිය වැඩි දියුණු කිරීමට, ප්‍රතිචාර දැක්වීම හා වැළැක්වීමේ කටයුතු සඳහා උපකරණ හා පුහුණුව සැපයීමට අප විසින් ඩොලර් මිලියන 39 ක් ලබා දෙනු ඇත. එහි සමුද්‍රීය ආරක්ෂාව තව දුරටත් වැඩි දියුණු කිරීම සඳහා මෑත දී එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට අධි දැරුම් ශක්තියක් සහිත නෞකාවක් ලබා දුන්නේ ය.

බංග්ලාදේශයේ වෙරළබඩ රේඩාර් පද්ධතිය දියුණු කිරීමට, ඔවුන්ගේ මුර සංචාර බෝට්ටු සමූහය නවීකරණය කිරීමට හා පුළුල් සමුද්‍රීය ප්‍රතිචාර හා නිරෝධන කටයුතු සඳහා පුහුණුව ලබා දීම ආදිය සඳහා තවත් ඩොලර් මිලියන 40ක් ලබා දෙනු ඇත.

නීති විරෝධී. නියාමනය නො කළ හා වාර්තා නොවන ධීවර කටයුතු, මුහුදු කොල්ලකෑම් හා බඩු හොරෙන් ගෙන යෑම මෙන් ම අනිතුත් ආකාරයේ අන්තර් ජාතික අපරාධ ආදිය වැළැක්වීමට මෙම වැඩි දියුණු කළ හැකියා අත්‍යවශ්‍ය මෙවලම් වේ. අපේ ප්‍රයත්න සැලසුම් කරන්නේ මේ කලාපයේ අපේ හවුල්කරුවන්ගේ කටයුතුවලට ගැළපෙන ලෙසයි.

උදාහරණයක් වශයෙන් යෝජිත ඉන්දියාවේ තොරතුරු සම්පර්ක මධ්‍යස්ථානය ගැන අපි ඉතා සතුටු වෙමු. එය කලාපයේ පොදු සමුද්‍රීය මෙහෙයුම්වල ඇති හිඩැස පුරවමින් සිංගප්පූරුවේ, මැඩගස්කරයේ හා බහරේන්වල ඇති එවැනි මධ්‍යස්ථාන සමග සමීප සහයෝගිතාවෙන් කටයුතු කරනු ඇත.

ඉන්දියාව හා ජපානය සමග ත්‍රෛපාර්ශ්විකවද, ඔස්ට්‍රේලියාවත් සමග චතුර්පාර්ශ්විකවද කටයුතු කරමින් සමුද්‍රීය වසම්වල ආරක්ෂාව පිළිබඳ මුල ධර්ම හා ප්‍රායෝගිකත්වය ගැන අපි ගවේෂණය කරමු.

මේ අතර පිළිවෙළින් දකුණු ආසියානු රටවල් 10 ක් හා ඉන්දු පැසිෆික් රටවල් හතක සහභාගීත්වයෙන් පැවැත්වෙන අපේ වාර්ෂික නාවික සුදානම හා පුහුණුව පිළිබඳ සහයෝගිතා වැඩසටහන හා දකුණු ආසියා සහයෝගිතා හා පුහුණු වැඩසටහන වැනි වැඩසටහන් මගින් ඉන්දු පැසිෆික් කලාපයේ රටවල් සමග අපි බහු-පාර්ශ්වික මානුෂීය ආධාර හා ආපදා ප්‍රතිචාර වැඩසටහන් පරාසයක් ම ක්‍රියාත්මක කරමු.

ඕනෑම ස්ථානයක හෝ ඕනෑම අවස්ථාවක ඇති වන සිදුවීම්වලට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය සහයෝගිතා පුරුදු මෙම අභ්‍යාස තුළින් ගොඩ නැගේ.

සමුද්‍රීය ආරක්ෂාව සඳහා සිදු කරන මෙම ආයෝජන මගින් භෞතික ශක්‍යතාව දියුණු කරන අතර ආරක්ෂක අභියෝගයන්ට මුහුණ දීම ඇතුළුව ඒ ඒ සමාජ හා එක් ව හොඳින් කටයුතු කිරීම දිරි ගන්වන මානව සබඳතා ගොඩ නැගීමේ වැදගත්කම ද අපි පිළිගනිමු.

මේ සඳහා එක්සත් ජනපදය විසින් මෑත දී ආරක්ෂක කටයුතුවල සිවිල් සමාජ සහභාගීත්වය වැඩි කිරීම මෙන් ම මෙම වැදගත් සංවාදවලට කාන්තාවන්ගේ හා සුළුතරයේ විශේෂඥයින් ඇතුළත් කර ගැනීම අරමුණු කර ගත් ඉන්දු පැසිෆික් ආරක්ෂා අධ්‍යයන පිළිබඳ අධි ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කරන ලදී.

පුද්ගලික අංශයට ඇති අවස්ථා හා ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට මගේ රජය ගන්නා උත්සාහයෙන් දෙස බැලීමට මම දැන් බලාපොරොත්තු වෙමි. මෙම එක්සත් ජනපද ප්‍රයත්නයන්ට පදනම වන්නේ මෙම තීරණාත්මක කලාපයේ විනිවිද පෙනෙන හා තිරසාර සංවර්ධනයකට පූර්ණ ලෙස සහාය වීමට සම්පත් ඇත්තේ පුද්ගලික අංශයේ පමණක් ය යන පිළිගැනීමයි. මෙතෙක් ඉන්දු පැසිෆික් කලාපයේ ආර්ථික සාර්ථකත්වය මෙහෙයවන ලද්දේ වෙළඳපොළ ආර්ථිකය, නිදහස් වෙළඳාම, පුද්ගලික අංශයේ මූල්‍ය සම්පත්, හා විවෘත ආයෝජන පරිසරයයි. මෙම වේදිකාවේ සාකච්ඡා කෙරෙන ඉන්දු පැසිෆික් කලාපයේ ආර්ථික වර්ධනය මෙහෙයවන බලවේගය වන්නේ ත් එම සාධකයි.

ජුලි මාසයේ වොෂින්ටනයේ පැවති ඉන්දු පැසිෆික් ව්‍යාපාර සංසදයේ දී කලාපයේ පුද්ගලික අංශයේ වර්ධනයට ආධාර කිරීමට එක්සත් ජනපද රජයට වැඩි අවස්ථාව උදා කරන නව පියවර තුනක් රාජ්‍ය ලේකම් පොම්පියෝ නිවේදනය කළේ ඒ නිසායි. මේ මගින් යටිතල පහසුකම්, ඩිජිටල් ආර්ථිකය හා බලශක්තිය යන මූලික අංශ තුන ගැන අවධානය යොමු කරනු ඇත.

මෙම සතියේ ජනාධිපති ට්‍රම්ප් විසින් අත්සන් කරන ලද බිල්ඩ් (BUILD) පනත පිළිබඳ ව අපි ප්‍රබෝධයට පත්වී සිටිමු. මෙම පනත මගින් හවුල්කාර රටවල ව්‍යවසායකයන් දිරි ගන්වන, රැකියා බිහි කරන හා දූගී බව අඩු කරන නවීන එක්සත් ජනපද සංවර්ධන මූල්‍ය ආයතනයක් ස්ථාපිත කරනු ඇත. එහි පූර්වගාමී ආයතනයට තිබූ අරමුදල් ප්‍රමාණය දෙගුණ කරමින් අලුත් එක්සත් ජනපද සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඩොලර් බිලියන 60ක් දක්වා වූ ණය සීමාවක් ලැබෙනු ඇත. වඩා වැදගත් වන්නේ අලුත් සංවර්ධන මූල්‍ය සංස්ථාවට විදේශවල කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීමට මෙන් ම වඩාත් ඵලදායී ලෙස අලුත් ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයන කිරීමට ද බලය ලැබීමයි. ණය මෙන්ම දේශපාලන අවදානමට රක්ෂණයක් ලබා දීමටත් එය දිගටම ක්‍රියා කරනු ඇත.

කලාපය තුළ වාණිජ ව්‍යාපෘති හඳුනා ගැනීමට හා ඒවායේ ආයෝජන කිරීමට එක්සත් ජනපද රජයේ හැකියාව වැඩි කරන අතර අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද (USAID) ආයතනය, භාණ්ඩාගාර හා වාණිජ දෙපාර්තමේන්තුව හා ව්‍යාපාරික මණ්ඩල හා කර්මාන්ත කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ආදිය මගින් වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට හා දේශීය පමණක් නොව විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගත හැකි ව්‍යාපාරික වාතාවරණයක් නිර්මාණය කිරීමට අපි මෙම රටවලට ආධාර කරමු.

කලාපයේ සමාන අදහස් ඇති හවුල්කරුවන් සමග අපි සමීප ව කටයුතු කරමු. උදාහරණයක් වශයෙන් ජනාධිපති ට්‍රම්ප් හා අගමැති අබේ බංග්ලාදේශයේ හා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන ද්වි-පාර්ශවික සහයෝගිතා ව්‍යාපෘති ගණනාවක් මෑතදී නිවේදනය කළෝය. ඒ ආකාරයට ම අපේ කටයුතුවලට ඉතා තීරණාත්මක වන ආසියාන් (ASEAN) රටවල් සමග සයිබර් සුරක්ෂිතතාව හා

තීරණාත්මක යටිතල පහසුකම් ආරක්ෂා කිරීම  ආදිය සම්බන්ධයෙන් එක්ව කටයුතු කරමු.

මම විස්තර කළ ක්‍රියා මාර්ග දෙකේ දී අවධානය යොමු කෙරෙන්නේ සමුද්‍රීය ආරක්ෂාව වැඩි දියුණු කිරීම හා ආයෝජනය හා වර්ධනයට අනුබල දීම සඳහා පුද්ගලික අංශය දිරිගැන්වීම ගැන වන අතර. මේ මගින් අපේ ඉන්දු පැසිෆික් මූලෝපායේ වැදගත් ම ලක්ෂණය වන ඉන්දියානු සාගර කලාපයේ වටිනා හවුල්කරුවෙකු ලෙස සිටීමට එක්සත් ජනපදයේ ඇති කැපවීම අවධාරණය කරයි.

නමුත් අප සියලු දෙනා ම මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන  කලාපීය සම්බන්ධතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කිරීමට මට දැන් ඉඩ දෙන්න. ලෝක ජනගහණයෙන් අඩක් සහිත, ලෝකයේ ආර්ථික ප්‍රතිදානයේ හතරෙන් පංගුවක් හිමි, මිහිපිට වේගයෙන් ම වර්ධනය වන ආර්ථිකයන් ඇති ඉන්දු පැසිෆික් කලාපය ලෝකයේ ඉතා ම සක්‍රීය ගාමික කලාපය වේ. කෙසේ වෙතත්  ඉන්දියානු සාගර කලාපය ලෝකයේ අඩුවෙන් ම සම්බන්ධ වී ඇති කොටස ද වෙයි. ලෝක බැංකුවට අනුව දකුණු ආසියානු අන්තර් කලාපීය වෙළදාම, කලාපයේ සම්පූර්ණ වෙළදාමෙන් සියයට පහකටත් අඩුවේ. සංසන්දනාත්මක ව, ආසියාන් රටවල මෙය සියයට 25ක් වන අතර යුරෝපීය රටවල සියයට 60 වේ. ඉන්දියාවට තම අසල්වැසියන් සමග වෙළදාම් කිරීමට වඩා ලාභයට බ්‍රසීලය සමග වෙළදාම් කළ හැකි වේ. මෙම ඉතා වැදගත් කලාපයේ සීමා මායිම් හරහා අන්තර් කලාපීය වෙළදාම සීමා කරන ප්‍රධාන සාධක වන්නේ දුර්වල වෙළදාම හා ප්‍රවාහණ පහසුකම් සහ සීමාකාරී නීති හා රෙගුලාසියි.

බාධක ඉවත් කිරීමෙන් හා රේගු ක්‍රියාමාර්ග මැනවින් සකස් කිරීමෙන් දකුණු ආසියාවේ අන්තර් කලාපීය වෙළදාම ඩොලර් බිලියන 28 සිට ඩොලර් බිලියන 100ක් දක්වා හතර ගුණයකින් පමණ වැඩි කළ හැකි යයි  ලෝක බැංකුව ඇස්තමේන්තු කර තිබේ.

මා අද මෙහි දී සඳහන් කළ සමුද්‍රීය සහයෝගිතාව වැඩි කිරීම, යටිතල  ආයෝජන පහසු කිරීම, මායිම් ඉක්මවා යන ඩිජිටල් ආර්ථිකයන් ප්‍රවර්ධනය කිරීම හා බලශක්ති වෙළඳපොළ සම්බන්ධ කිරීම ආදිය මේ සඳහා උපකාරී වනු ඇත.

නමුත් පැහැදිලිව ම තවත් බොහෝ දේ කළ යුතු වේ. ඉන්දියානු සාගරයේ නව අනාගතය පැහැදිලි කරන මෙම සම්මන්ත්‍රණයේ සාකච්ඡා ගැන අපි මහත් ඕනෑ කමින් බලා සිටිමු. විශාල ඉන්දු පැසිෆික් කලාපයේ කොටසක් ලෙස නිදහස් හා විවෘත ඉන්දියානු සාගර කලාපයක් සහතික කිරීමට කිසි විටෙකත් නැති තරමට අද එක්සත් ජනපදය කැප වී ඇති අතර ජනාධිපති ට්‍රම්ප් ප්‍රකාශ කර ඇති පරිදි "ශක්තිමත්, සමෘද්ධිමත් හා ආත්ම විශ්වාසයක් ඇති" රටවල් වලින් සමන්විත ඉන්දු පැසිෆික් කලාපයක් නිර්මාණය කිරීමට අපේ හවුල්කරුවන් සමග කටයුතු කිරීමට ලැබෙන මෙම අවස්ථාව අපි සාදරයෙන් පිළිගනිමු.

ඔබට බොහෝ ම ස්තුතියි.